**කළුතර අධ්‍යාපන කලාපය**

**දෙවන වාර ඇගයීම - 2018**

**11 ශ්‍රේණිය** | **විෂයය : පෙරදිග සංගීතය - I** | **කාලය : පැය 1.00 යි**

නම : ..............................................................................................................................................

- සියල්ලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

---

01. රාගයකට තිබිය යුතු අවම ස්වර ගණන,
    (i) 6 කි. (ii) 5 කි. (iii) 7 කි. (iv) 8 කි.

02. රාගයක් හඳුනා ගැනීමට ඉවහල් වන ප්‍රධාන ස්වර සංගතිය හඳුන්වන නම කුමක්ද?
    (i) මේලය (ii) තානාලංකාර (iii) මුඛ්‍යාංගය (iv) අනුවාදී ස්වර

03. මධ්‍යමය හා නිශාදය වර්ජ්‍ය වන රාගයේ අනුවාදී ස්වර වන්නේ,
    (i) සරිමපධ (ii) රිගමධනි (iii) සරිමපනි (iv) සරිප

04. කල්‍යාණ මේලයෙන් උපදින රාග යුගලයකි,
    (i) යමන් - බිලාවල් (ii) යමන් - භූපාලි
    (iii) භූපාලි - බිලාවල් (iv) කාෆි - භූපාලි

05. ස්වර මාලිකා නමින් හඳුන්වන ගී විශේෂය වන්නේ,
    (i) ස්වර ස්ථාපන ගී (ii) මධ්‍යලය ගී (iii) ලක්ෂණ ගී (iv) සර්ගම් ගී

06. | ස ධ ප ධ | ම ප ග ම | වශයෙන් ආරම්භ වන සර්ගම් ගීතය අයත් රාගය,
    (i) භෛරවී රාගය (ii) කාෆි රාගය (iii) යමන් රාගය (iv) භූපාලි රාගය

07. ස්වර සප්තකය තුළ ඇති ශුද්ධ, කෝමල, තීව්‍ර සියලුම ස්වරයන්ගේ එකතුව වනුයේ,
    (i) 12 කි. (ii) 7 කි. (iii) 8 කි. (iv) 13 කි.

08. රාගයක ජීව ස්වරය ලෙස හඳුන්වන්නේ,
    (i) විවාදී ස්වරයයි. (ii) සංවාදී ස්වරයයි. (iii) වාදී ස්වරයයි. (iv) වර්ජ්‍ය ස්වරයයි.

09. සරි ගම පධ නිස් | නිධ පම ගරි ස- යනු,
    (i) කාෆි රාගයට අයත් සපට් තානයකි.
    (ii) කාෆි රාගයට අයත් අලංකාරික තානයකි.
    (iii) කාෆි රාගයට අයත් ස්වර අභ්‍යාසයකි.
    (iv) කාෆි රාගයට අයත් මිශ්‍ර තානයකි.

10. භාරතීයයන් අදහන සැම දෙවි කෙනෙකුන් වෙනුවෙන් නිර්මාණය කළ භක්ති රසයෙන් යුත් ගායනා ශෛලියකි,
    (i) කව්වාලි ගී (ii) ගසල් ගී (iii) ඛ්‍යාල් ගී (iv) භජන් ගී

11. සරල ගීයක අන්තරා කොටස ව්‍යවහාරික සංගීතයට අනුව හඳුන්වන නාමය,

(i) Interlude (ii) Verse (iii) Chorus (iv) Introduction

12. හින්දුස්ථානී සංගීතයේ ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩය වනුයේ,

(i) වයලීනය (ii) සිතාරය (iii) එස්රාජ් (iv) වීණාව

13. පහතරට සිංදු වන්නම් ගැයෙන තාලය වනුයේ,

(i) මැදුම් තනි තිත (ii) පසන් තාලය

(iii) නළු ගීතිකා තාලය (iv) දාදරා තාලය

14. යක් බෙරය හැඳින්වීමට භාවිතා කරන නම් රාශියක් ඇත. පහත පිළිතුරු අතරින් නොගැළපෙන නාමයකි,

(i) පහතරට බෙරය (ii) දික් බෙරය

(iii) ගැට බෙරය (iv) දෙවොල් බෙරය

15. දීප්චන්දි තාලයට සමාන දේශීය තාලයකි,

(i) සුළු මැදුම් දෙතිත (ii) සුළු මහ දෙතිත

(iii) මහ තනි තිත (iv) මැදුම් මහ දෙතිත

16. නාමිකව හා භාවිතයේ පවතින සබරගමු වන්නම් සංඛ්‍යාව පිළිවෙළින්,

(i) 18, 24 (ii) 24, 18 (iii) 24, 32 (iv) 32, 18

17. C Major Scale එකට අයත් ගීතයකට යෙදීමට වඩාත් සුදුසු Major Chords වන්නේ,

(i) C, F, G (ii) $B^b$, C, D (iii) E, C, G (iv) C, E, G

18. ස්වර සප්තකයේ පිහිටීම අනුව අර්ධ ස්වර පරතර (Semitone) පිහිටි ස්වර යුගල වන්නේ,

(i) මප - නිස්̇ (ii) ගම - නිස්̇ (iii) ගම - ධනි (iv) පධ - නිස්̇

19. D Major Chord එකට අයත් ස්වර වන්නේ,

(i) රි ම ධ (ii) රි ම/ ධ (iii) රි ම නි (iv) රි නි̲ රි

20. අපරදිග සංගීත පද්ධතියට අයත් ස්වර සංවාද ක්‍රමය (ස්වර සුසංගත වීම) හැඳින්වීමට භාවිතා කරන නාමයකි,

(i) Symphony (ii) Scale (iii) Harmony (iv) Melody

21. "මල් පිබිදීගෙන එන්නේ" මෙම ගී පාදයේ ඇති ලඝු ගුරු අක්ෂර සංඛ්‍යාව පිළිවෙළින් යෙදී ඇති පිළිතුර වනුයේ,

(i) ලඝු 4 ගුරු 2 (ii) ලඝු 4 ගුරු 4 (iii) ලඝු 6 ගුරු 2 (iv) ලඝු 2 ගුරු 4

22. විෂමග්‍රහයෙන් ගැයෙන ගීයකි,

(i) සුවඳ පද්ම ඕලු ආදි (ii) දන්නෝ බුදුන්ගේ

(iii) හෙළ ජාතික අභිමානේ (iv) නිල් අහස් තලේ අගේ

23. බටහිර සංගීතයට අනුව Dotted Crotchet එකක වටිනාකම,

(i) මාත්‍රා 3 කි. (ii) මාත්‍රා 1½ කි. (iii) මාත්‍රා 2½ කි. (iv) මාත්‍රා 3½ කි.

24. කුස පබාවතී නාට්‍යයේ ඇතුළත් ගීතයකි,

(i) අපෙ මුනි සඳ ඉර්දි බලෙන් (ii) රතදර සිරි පරදන

(iii) රස බොජුනක් නැතත් (iv) සෝබාව දේ මෙපුර සිරි විසිතුරු

25. ගැමි ගී නිර්මාණයට පදනම් වූ හේතු සාධකයක් නොවන්නේ,

(i) ඇදහිලි හා විශ්වාස (ii) ජීවන වෘත්තීන්

(iii) රස වින්දනය (iv) සමාජ අවශ්‍යතා හා විනෝදාස්වාදය

26. කායදා, තිහායි, රේලා, චක්‍රදාර් වැනි ශිල්ප ක්‍රම භාවිතා වනුයේ,

(i) බටනලා වාදනයේ දී ය. (ii) වයලීන් වාදනයේ දී ය.

(iii) සිතාර් වාදනයේ දී ය. (iv) තබ්ලා වාදනයේ දී ය.

- පහත වගුවේ ඇතුළත් කරුණු නිවැරදිව ගළපමින් අංක 27 සිට 30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| A. උඩරට වන්නම් | (අ) කොහොව්යනා හඬනගනා |
| | (ආ) සේවිත පාද සරෝරුහ |
| B. සබරගමු වන්නම් | (ඉ) මෝරා බීජයෙනා |
| | (ඊ) රන් රසා සේ ම වඩන |
| C. පහතරට වන්නම් | (උ) ඉපිද එ බෝසත් නාලොව |

27. පහතරට සිංදු වන්නම් හා සම්බන්ධව නිවැරදි වන්නේ,

(i) C සහ (ආ) තොරතුරු ය. (ii) C සහ (ඊ) තොරතුරු ය.

(iii) C සහ (උ) තොරතුරු ය. (iv) C සහ (ඉ) තොරතුරු ය.

28. තිත් රූප දෙකකින් ගැයෙන වන්නම හා සම්බන්ධව නිවැරදි වන්නේ,

(i) B සහ (ඉ) තොරතුරු ය. (ii) B සහ (උ) තොරතුරු ය.

(iii) B සහ (ඊ) තොරතුරු ය. (iv) B සහ (අ) තොරතුරු ය.

29. "රුක් අත්තන මල මුදුනේ" ගීතයේ තනු නිර්මාණයට පාදක කරගත් වන්නම හා සම්බන්ධව නිවැරදි වන්නේ,

(i) A සහ (ආ) තොරතුරු ය. (ii) A සහ (ඊ) තොරතුරු ය.

(iii) A සහ (උ) තොරතුරු ය. (iv) A සහ (ඉ) තොරතුරු ය.

30. බෙර පදය, තානම,කවිය, ඉරට්ටිය යන අංග ඇතුළත් වන්නම් සම්ප්‍රදාය හා සම්බන්ධව නිවැරදි වන්නේ,

(i) C සහ (අ) තොරතුරු ය. (ii) C සහ (ඉ) තොරතුරු ය.

(iii) C සහ (ආ) තොරතුරු ය. (iv) C සහ (ඊ) තොරතුරු ය.

31. තබ්ලාවේ දායාවෙන් හා බායාවේ එකතුවෙන් උපදින අවනද්ධ අක්ෂර දෙකකි,

(i) ත, ධිං (ii) ධ, තිං (iii) ධිං, තිං (iv) ධ, ධිං

32. හින්දුස්ථානී තාලයක මුල් මාත්‍රාව මත යෙදෙන තාල සංඥාවකි,

(i) O (ii) X (iii) 2 (iv) 3

33. සගරිගරිස, රිමගමගරි, ................ යනාදී වශයෙන් ගොඩනැගෙන ස්වර අභ්‍යාසයේ ඊළඟ ස්වර ඛණ්ඩය වන්නේ,

(i) ගමපගමරි (ii) ගමරිගමප (iii) ගපමපමග (iv) ගපමගරිස

34. “දෙපානෝ” ගීත නාට්‍යය නිර්මාණය කරන ලද්දේ,

(i) දයානන්ද ගුණවර්ධන සූරීන් විසිනි. (ii) හෙන්රි ජයසේන සූරීන් විසිනි.

(iii) ලූෂන් බුලත්සිංහල සූරීන් විසිනි. (iv) ඩබ්ලිව්.බී. මකුලොළුව සූරීන් විසිනි.

35. වයලීනයේ තත් හතර බටහිර (අපරදිග) ක්‍රමයට නම් කර ඇති පිළිතුර තෝරන්න.

(i) EADG (ii) FCGD (iii) GCGC (iv) GDAE

36. ලාවනී තාලයේ මාත්‍රා විභාග වන්නේ,

(i) මාත්‍රා 3 + 3 ලෙසට ය. (ii) මාත්‍රා 2 + 2 ලෙසට ය.

(iii) මාත්‍රා 2 + 4 ලෙසට ය. (iv) මාත්‍රා 3 + 3 ලෙසට ය.

37. “මෝසාර්ට්” නම් බටහිර සංගීතඥයාගේ විශිෂ්ට සිම්පනි අතරට අයත් නොවන්නේ,

(i) කෝරල් සිම්පනියයි. (ii) ජුපිටර් සිම්පනියයි.

(iii) ප්‍රාග් සිම්පනියයි. (iv) ද මැජික් ෆ්ලූට් සිම්පනියයි.

38. නූතන ලෝකයේ සංධ්වනි නිර්මාණය කරමින් ලෝක ප්‍රසිද්ධ සංගීතඥයකු බවට පත් ව සිටින ඉතාලි ජාතික සංගීතඥයා වන්නේ,

(i) මෝසාර්ට් (ii) බීතෝවන් (iii) යානි (iv) ඒ. ආර්. රහුමාන්

- ප්‍රශ්න අංක 39 - 40 දක්වා පිළිතුරු සඳහා පහත සටහන ඇසුරු කර ගන්න.




39. තත් සංඛ්‍යාව හා ඉහත ආකාරයට තත් සුසර කරන වාද්‍ය භාණ්ඩය වන්නේ,

(i) බේස් ගිටාරය (ii) සිතාරය (iii) බොක්ස් ගිටාරය (iv) මැන්ඩලීනය

40. සටහනේ දැක්වෙන ආකාරයට 1, 2, 3, 4 යන ස්වර එකවර නාද කළ විට අයත් වන කෝඩ් (Chord) එක නම් කරන්න.

(i) G - Major (ii) C - Minor (iii) C - Major (iv) G - Minor

**කළුතර අධ්‍යාපන කලාපය**

**දෙවන වාර ඇගයීම - 2018**

**11 ශ්‍රේණිය** **විෂයය : පෙරදිග සංගීතය - II** **කාලය : පැය 2.00 යි**

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

---

**01.** කෙටි පිළිතුරු සපයන්න.

(i) ස්වර සප්තකයට අයත් ස්වර 12 ම යොදාගත හැකි රාගය නම් කරන්න.

(ii) රාගධාරී මධ්‍යලය ගීතයක වචන යොදා ගෙන ගොඩනගන තානාලංකාර හඳුන්වන්නේ කුමන නමකින්ද?

(iii) ආඝාතාත්මක මෙහෙගීයක පළමු පාදය ලියන්න.

(iv) වයලින් පවුලට අයත් භාණ්ඩයක් නම් කරන්න.

(v) පෘතුගීසි ජාතිකයන්ගේ සංගීතාංගයක් ලෙස ලංකාවේ ප්‍රචලිත වූ ගායන ශෛලිය නම් කරන්න.

(vi) භෛරවී රාගය ආශ්‍රිත සරල ගීයක මුල් පද පේළිය ලියන්න.

(vii) නිරිස, නිරිගරිස...... මෙහි ඊළඟට යෙදෙන ස්වර ඛණ්ඩය ලියන්න.

(viii) විතත භාණ්ඩයක් නම් කරන්න.

- අංක (ix) සිට (xii) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සඳහා වරහන් තුළ ඇති වචන උපයෝගී කර ගන්න.
(තටු / සුවඳ සබන් ඇඟ ගාලා / සෝබාව දේ / රතු හැට්ටකාරී)

| | **<u>නාට්‍ය</u>** | **<u>ගීතය</u>** |
|---|---|---|
| (ix) | රාජකපුරු | .............................. |
| (x) | .............................. | යස ඉසුරු පිරුණු තැනා |
| (xi) | .............................. | අපි කිරිල්ලියෝ |
| (xii) | තාරාවෝ ඉඟිලෙති | .............................. |

(ලකුණු 12)

**02.** පහත දී ඇති ස්වර සංගති ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - සධසරිගරිග, ධපගරිස
B - පරිනිරිස, නිරිගමප
C - ගපමග මරිස
D - රිපමප ගරි, රිනිධනිපධමප
E - සරිස, ධ නිස, මගරිස

(i) ඉහත ස්වර සංගතීන් අයත් රාග හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 05)

(ii) A හෝ D රාගයට අයත් මේලය, ආරෝහණ ස්වර, අවරෝහණ ස්වර, වාදී, සංවාදී, ගායන සමය නම් කරන්න. (ලකුණු 03)

(iii) ඉතිරි රාග හතරෙන් එක් රාගයක් මධ්‍යලය ගීතයක් හෝ ලක්ෂණ ගීතයක ස්ථායී කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

**03.** (i) තාල පිළිබඳ දැනුම භාවිතා කර, දී ඇති වගුවෙහි හිස්තැන් සම්පූර්ණ කරන්න.

| | විභාග | මාත්‍රා | තාල සංඥා | බටහිර තාල සංකේතය | දේශීය තාලය |
|---|---|---|---|---|---|
| A | ……… | 6 | x 0 | $\frac{3}{4}$ | ……………………… |
| B | 4 | ……… | x 203 | ……… | මහ තනි තිත |
| C | 4 | 14 | ……… | $\frac{7}{8}$ | ……………………… |
| D | ……… | 10 | x 203 | ……… | සුළු මැදුම් දෙතිත |

(ලකුණු 04)

(ii) A, B, C, D අක්ෂරවලට හිමි තාල හතර නම් කරන්න. (ලකුණු 04)

(iii) C හෝ D තාල දෙකෙන් එක් තාලයක ධෛකාව නියමිත තාල සංකේත යොදා ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

**04.** (i) ශ්‍රී ලංකාවේ ජන ගී, ගැමි ගී / සේ ගී වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදේ. පහත දැක්වෙන ජන ගී පාද එම කොටස් දෙකට අනුව වගුගත කරන්න.

A - වරම් ගතිම් ඉර සඳ දෙවි අතින් වරම්
B - පැහැ සරණිය මිණි පැමිණිය කොත් අගට
C - ඔන්න මලේ ඔය නා මල නෙලා වරෙන්
D - සාර සදිසි පෙති පේර නෙලන කල
E - මනමත් කරවන දන මුළු දෙරණා
F - බුද්ධං සරණේ සිරස දරාගෙන
G - අතට වෙරළු ඇහිඳ ගෙනේ
H - චන්ද නන්දන රාජ කුංජන
I - සේවිත පාද සරෝරුහ සන්ජිත
J - ඉපිද එ බෝසත් නාලොව වාරෙක (ලකුණු 05)

(ii) ගැමි ගී නිර්මාණය වීමට බලපෑ හේතු සාධක තුන නම් කර ඒ අනුව ගොඩනැගුණ ගී වර්ග තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) ගැමි ගී හා සේ ගී පිළිබඳ කරුණු දෙකක් සංසන්දනාත්මකව විස්තර කරන්න. (ලකුණු 04)

**05.**



(i) ප්‍රස්තාරයට අදාළ බටහිර තාල සංකේතය (Time Signature) ලියන්න. (ලකුණු 02)

(ii) ඉහත බටහිර ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පෙරළා ලියන්න. (ලකුණු 04)

(iii) ස්වර ප්‍රස්තාරයේ මුල් විභාග හතරට සුදුසු කෝඩ්ස් හතර සඳහන් කරන්න. (ලකුණු 04)

(iv) මුල් විභාග හතරට සුදුසු Harmony ස්වර පාදයක් ලියන්න. (ලකුණු 02)

**06.** ශ්‍රී ලංකාවේ පැවති රංග සම්ප්‍රදායන් දෙකකට අදාළ තොරතුරු පහතින් දක්වා ඇත.

(i) එම රංග සම්ප්‍රදායන් දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) දී ඇති තොරතුරු එම රංග සම්ප්‍රදායන් දෙකට අනුව වෙන් කර ලියන්න. (ලකුණු 04)

(iii) එම සම්ප්‍රදායන් දෙකට අයත් නාට්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iv) ඉන් එක් රංග සම්ප්‍රදායකට අයත් ගීතයක මුල් කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

- කර්ණාටක සංගීතයේ ආභාසය ලබා ඇත.
- ස්ථායී අන්තරා ආකෘතියෙන් යුක්තය.
- හින්දුස්ථානී සංගීතයේ ආභාසය ලබා ඇත.
- මද්දල දෙකක් වාදනය කරයි.
- දොහොරාව නම් විශේෂ අංගයකින් යුක්ත වේ.
- පොතේ ගුරාගේ චරිතය ඇතුළත් ය.
- උරුට්ටුව, තෝඩායම වැනි විශේෂ අංගවලින් යුක්තයි.
- තබ්ලාව හා සර්පිනාව ප්‍රධාන වාද්‍ය භාණ්ඩ ලෙස යොදා ගනියි.

**07.** (i) මෝසාර්ට්, බීතෝවන්, යානි යන සංගීතඥයන් තිදෙනාගෙන් එක් අයෙකු පිළිබඳ ජීවන තොරතුරු දෙකක් හා සංගීතමය තොරතුරු තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

(ii) බටහිර සංගීත සංධ්වනි පිළිබඳ කරුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) පෙරදිග/අපරදිග හෝ දේශීය සංගීත භාණ්ඩ වර්ගීකරණයන් අතරින් එක් වර්ගීකරණයක් උදාහරණ සපයමින් ලියා දක්වන්න. (ලකුණු 04)